CPA

CENTRE FOR POLICY ALTERNATIVES

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය - වසර 73 ක නිදහස

**2021 පෙබරවාරි, කොළඹ, ශ්‍රී ලංකාව:** ශ්‍රී ලංකාවේ 73 වන නිදහස් දිනය ආසන්නයේ තිබියදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රී ලංකාවේ ජාතිකත්ව-ආගමික සම්බන්දතාවයන්ගේ අද පවතින තත්වය සහ ප්‍රජාතාන්ත්‍රික ආයතනයන් හට එල්ලවී ඇති තර්ජනයන් පිළිබඳව සිය දැඩි සැලකිල්ල යොමුකර සිටී. මේ කරුණු වලට අප අවධානය යොමු වන්නේ ලෝකව්‍යාප්ත වසංගතයක්, උච්චත්වයට පත්වූ අධිකාරිවාදයට හා හමුදාකරණයට ලක්වූ ආණ්ඩු කරණයක්, ශක්තිමත්ව මුල්බැසගත් දණ්ඩනමුක්තියක් සහ මූලික නිදහසවල් කෙරෙහි වැඩිවැඩියෙන් නැගීගෙන එන තර්ජනයන් යනාදියෙහි සන්ධර්භය තුලය. නව මට්ටම් වලින් සිදුවන ආවේක්ෂණයන්, උසිගැන්වීම් සහ සුළුතර ජනකොටස් ඉලක්කකොටගැනීම් යනාදිය හේතුකොටගෙන විසම්මුතිය සඳහා වන අවකාශය හැකිලෙමින් පවතින වාතාවරනයකදී මේවා මෙසේ සිදුවන බවද කිවයුතුවෙයි. හිජාස් හිස්බුල්ලා, රම්සි රසීක් හා අනාෆ් ජසීම් ඇතුළු, ලේඛකයන්, නීතීඥයන් හා මාධ්‍යවේදීන් යනාදී කිහිප දෙනෙකුම අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබාගැනීම් වඩා පුළුල්ව පවතින මෙම ක්‍රියාදාමයට උදාහරණ කිහිපයක් වෙයි. මෙම අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබාගැනීම් වලදී නීතියේ නිසි ක්‍රියාදාමයන් පිලිබඳ සහතිකවීම් හානියට පත්ව ඇති අතර මෙවැනි අත්අඩංගුවට ගැනීම්හි සැබෑඅරමුණු කවර ඒවා ද යන්න පිළිබඳවද ප්‍රශ්න පැනනැගී ඇත. කොවිඩ් 19 මරණ වලදී මෘත දේහයන් බලහත්කාරයෙන් ආදාහනය කිරීමේ අධිකාරීවාදී තීන්දුව පිළිබඳවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තදබලලෙස කනස්සල්ලට පත්ව සිටී . කිසිඳු විද්‍යාත්මක පදනමක් නොමැති කෘර ප්‍රතිපත්තිමය තීන්දුවක් වන මෙය මගින් ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාවවෙත සෘජු බලපෑමක් ඇතිවන අතර ඔවුන් තවදුරටත් කොන්වීම ද මේ මගින් සිදුවනුඇත. මෙම කනස්සල්ල දනවනසුළු වර්ධනයන් තවත් සංකීර්ණ කරවමින් රාජ්‍ය ප්‍රතිපත්තිය කෙරෙහි සිංහල-බෞද්ධ ජනවාර්ගික-ජාතිකවාදය මගින් ඇතිකරන බලපෑම ද උච්චත්වයට පත්වෙමින් පවතී. ප්‍රධාන බෞද්ධ හිමිවරුන් ගණනාවක් විසින් ක්‍රියාත්මක කරන විශාල බලපෑම් සහිත භූමිකාව මෙන්ම උතුරු නැගෙනහිර පලාත්වල ජනවිකාශනය වෙනස් කිරීමට කරනු ලබන ක්‍රමානුකූල උත්සාහයන් මගින් ද මේ බව පැහැදිලිවේ. මේ මගින් මැතිවරණ දේශපාලනයට, ජනතාව අතර සහජීවනයට හා සන්හින්දියාවටද දීර්ඝකාලීන බලපෑම් සිදුවනු ඇත.

ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු දා පටන් වරින් වර බලයට පැමිණි රජයයන් හි ප්‍රධාන අසමත්වීම් අවබෝධ කරගැනීමට වටිනා අවස්ථාවක් නිදහස් සමරු දිනය මගින් සපයයි. මේ අතරිනුත් සියලු රටවැසියන් හට සමසේ බෙදී යන සෞභාග්‍යයක් සහ සාමකාමී හා ස්ථාවර රටක් උදාකරගැනීමට අසමත්වීම විශේෂවෙයි. ගත වූ වසරතුල ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සම්බන්දතාවයන් වැඩිදියුණු කිරීමට කිසිඳු උත්සාහයක් රජය විසින් නොගත්තා පමණක් නොව රජයේ ප්‍රතිපත්ති මගින් සක්‍රිය ලෙස ජනවාර්ගික ආතතීන් උග්‍ර කිරීමක් මෙන්ම ප්‍රජාවන් කොන්වීමකට ලක්කිරීමක් ද සිදුවිය. රජය නියෝජනය කරන්නේ එය තෝරාපත්කරගැනීමට ඡන්දය පාවිච්චි කළවුන් පමණක්ය යන වැරදි විශ්වාසය මෙන්ම ශ්‍රී ලංකාවේ යුධ ගැටුමේ පැවැත්මට ආධාරක වූ දේශපාලන ගැටුම් හඳුනාගැනීමට නොහැකිකම ද රජයේ මෙම අසමත් භාවයට හේතුකාරක විය.

පසුගිය වසරවලදී වගවීම හා විනිවිදභාවය පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම යනාදී උත්සාහයන් හි නිරත වූවන් ඉලක්කකරගැනීම පිළිබඳවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙහිදී වැඩිදුරටත් සැලකිල්ල යොමුකරයි. මේ සම්බන්ධයෙන් වන ආසන්නතම සිදුවීම නම් අතීත සහ වර්තමානයේ සිදුවෙමින් පවත්නා අධිකරණ ක්‍රියාදාමයන්හී සුපිලිපන්භාවය පිළිබඳව බරපතල සැකසංකා ඉස්මතුකරන දේශපාලන පලිගැනීම් පිළිබඳව වන ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවයි. දේශපාලන පලිගැනීම් පිළිබඳ මෙම ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිණිස රජය වේගයෙන් කටයුතු කරමින් සිටින

නමුත් නීති උල්ලංඝනයන් හා ප්‍රචණ්ඩත්වයන් පිළිබඳව වූ මින් පෙර කොමිෂන් සභාවන්ගේ සීමිත නිර්දේශයන් පවා ක්‍රියාත්මක කිරීමට ගෙන ඇත්තේ බෙහෙවින් සුළු ක්‍රියාමාර්ගයන්ය. තවත් බෙහෙවින් කනගාටුදායක තත්වයක් වන්නේ මෙම ජනවාරියේ දී "වර්තමාන රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලවන පරිදි" මින්පෙර කොමිෂන් සභාවල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව විමර්ශන සහ පරීක්ෂණ සිදුකිරීමට තවත් අලුත් ජනාධිපති කොමිෂන් සභාවක් පත්කිරීමයි. යම් අවංක ක්‍රියාමාර්ග ගැනීමකට ඉඩකඩ බෙහෙවින් අඩු හෝ ඇත්තේම නැති මෙවැනි දීර්ග කොමිෂන් සභා ලැයිස්තුවකට තවත් එක් කොමිෂන් සභාවක් එකතුවීමක් පමණක් මෙයින් සිදුවනු ඇත.

ලෝක ව්‍යාප්ත වසංගතයක් මධ්‍යයේ පැවැත්වෙන පළමු නිදහස් දිනය මෙය වන අතර උත්සවශ්‍රීයෙන් ඔබ්බටගොස් පවතින යථාර්තයන්හි කටුකබව පිළිබඳව සිතා බැලීමට මෙය කදීම කාලයක් වෙයි. ඉහත කී අභියෝගයන් ආර්ථික අර්බුදය මගින් තවත් නරක අතට හැරවෙනු ඇතිබව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලකිල්ලට ගනී. ව්‍යුහාත්මක අසමානතාවයන් හා බොහෝ ශ්‍රී ලාංකිකයන් විසින් මුහුණපාන දුෂ්කරතාවයන් එමගින් ඉස්මතුකොට දක්වයි. මෙම ආර්ථික හා සමාජයීය අභියෝගයන් වෙත හදිසි අවධානයක් අවශ්‍යවේ. මේ දක්වා මෙම ව්‍යුහාත්මක ගැටළු ආමන්ත්‍රණය කිරීමට අංග සම්පූර්ණ සැලසුමක් ඇත්තේ නැත. රජය යොමුවී ඇත්තේ කාර්ය සාධක බලකායයන් පිහිටුවීමට, හිටපු සහ සේවයේ යෙදීසිටින හමුදා නිලධාරීන්හට ප්‍රමුඛ ස්ථානයක් ලබාදීමට සහ තාවකාලික ආධාර යෝජනා ක්‍රමයන්ටය.

මෙම නිදහස් දිනය සමරනු ලබන අවස්ථාවෙහි වන තවත් සන්දර්භයක් වන්නේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිලිබඳ මහකොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ තත්වය දැඩිලෙස විවේචනයට ලක්කරන වාර්තාවක් නිකුත්කර ඇති තත්වයක් පැවතීමයි. අතීත උල්ලංඝනයන් පිළිබඳව කටයුතු කිරීමේදී ශ්‍රී ලංකාව පෙන්වන අඳුරු ඉතිහාසය පිලිබඳව වූ උරුමය එම වාර්තාව මගින් සැලකිල්ලට ගෙන ඇති අතර එවැනි උල්ලංඝනයන් ගණනාවක් පිළිබඳව ලේඛනගත කිරීමක්ද එමගින් සිදුවේ. ශ්‍රී ලංකාවේ රජයට, සාමාජික රාජ්‍යයන් හට සහ එකසත් ජාතීන් හට කරනු ලබන නිර්දේශයන් ලැයිස්තුවක්ද මෙම වාර්තාවට ඇතුලත් වේ. වර්තමාන සන්ධර්භය තුල ශ්‍රී ලංකාවේ මානව හිමිකම්, යුක්තිය හා සංහිඳියාව විෂයයෙහි කටයුතු කිරීමෙහිදී අත්කරගත හැක්කේ සීමිත ප්‍රගතියක් පමණක්ය යන්නද එමගින් දැක්වේ. මෙම වාර්තාව සහ ශ්‍රී ලංකාවේ කනගාටුදායක වර්ධනයන් පිළිබඳව වන අනෙකුත් ලියකියවිලි සැලකිල්ලට ගත්විට කිවහැක්කේ මෙම සැලකිලිමත්වියයුතු කරුණු වගකිවයුතු ආකාරයකින් ආමන්ත්‍රනය කිරීමේ මූලික වගකීම ශ්‍රී ලංකාවේ රජය සතුවන බවයි. ඒ වෙනුවට රාජ්‍යතාන්ත්‍රික උපායමාර්ගික මවාපෙන්වීම් වෙත යොමුවීම මගින් ශ්‍රී ලංකාවේ සියලු පුරවැසි කණ්ඩායම්හට ගෙනදෙනු ඇත්තේ අහිතකර ප්‍රතිඵලයක්මය. සියලු පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට රජය අකමැතිනම් හෝ අසමත්නම් හර කණ්ඩායම (core group) වෙතින් හා සාමාජික රාජ්‍යයන් වෙතින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉල්ලා සිටින්නේ මානව හිමිකම් පිලිබඳ මහකොමසාරිස් කාර්යාලයේ වාර්තාවේ සොයාගැනීම් හා දැනට සිදුවෙමින් පවතින හා අතීතයේ සිදුවූ උල්ලංඝනයන් පිළිබඳව කටයුතු කිරීම පිණිස ගතයුතු ක්‍රියාමාර්ගයන් නිරූපනයවන ප්‍රබල යෝජනාවක් ඉදිරිපත් කරන ලෙසය. එවැනි මුලපිරීමක් ශ්‍රී ලංකාව තුල මානව හිමිකම්, නීතියේ ආධිපත්‍යය, වගවීම සහ සංහිඳියාව ශක්තිමත් කිරීමට ප්‍රධාන ලෙස උපකාරී වනු ඇත.

මෙනයින් ගත්කල, මෙම සතියේ දී සිදුවන උත්සව පැවැත්වීම් තිබියදී වුවද කිවයුතුව ඇත්තේ ශ්‍රී ලංකාවේ පවතින තත්වය බරපතල ලෙස සැලකිලිමත් වියයුතු වූවක් වන බවය. මෙම අවස්ථාවේදී ඒවායේ ප්‍රතිඵලය වෙනස් වනු ඇතිය යන නොමග යවනු ලැබූ විශ්වාසය මත පදනම්ව ඓතිහාසික වැරදි නැවත සිදුකරනු ලබමින් තිබේ. සුපුරුදු පරිදි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ක්‍රියාවලිය පිළිබඳව විශාල හඬ නැගීමක් සිදුවනු ඇත. නමුත් වාග් අලන්කාරෝක්තීන් සැලසුම් කරනු ලබනු ඇත්තේ අවධානය හා ක්‍රියාමාර්ග අන් අතකට යොමු කිරීම පිණිසය. රටේ ක්‍රියාත්මකව පවතින සැබෑ අනතුරු වෙත අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සහ දෙනු ලැබ ඇති පොරොන්දු පිළිබඳව ප්‍රවේශමෙන් අවධානාත්මක වනලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉල්ලා සිටී. මෙහිදී අප විසින් අවධානය යොමුකර ඇති ප්‍රවණතාවයන් නොතකා හැරියයුතු නොවේ. ශ්‍රී ලංකාවේ දුර්වල ප්‍රජාතන්ත්‍රවාදයට ඇති තර්ජනයන් හට ශක්තිමත් ලෙස හා සාමකාමී ලෙස අභියෝග කිරීමට මේ අප සැමට ඇති කාලයයි.